*සැ. යු.*- 2018.11.30 දින පළ වූ අංක 2,100 දරන *ගැසට් පත්‍රයේ* I : III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,101 - 2018 දෙසැම්බර් මස 07 වැනි සිකුරාදා - 2018.12.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 02 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 දෙසැම්බර් මස 28 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 දෙසැම්බර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ (සත්ත්ව සංවර්ධන උපදේශක) III පන්තිය සහ (සත්ත්ව සංවර්ධන උපදේශක) පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම - 2018

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඉහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(i) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සත්ත්ව සංවර්ධන උපදේශක) III පන්තිය ;

(ii) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සත්ත්ව සංවර්ධන උපදේශක) පුහුණු කිරීමේ ශ්‍රේණිය.

03. 3.1 *පොදු සුදුසුකම්.-*

*(අ)* ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

*(ආ)* යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර ස්ථිර පදනමින් තනතුරට පත් කරන ලද සෑම නිලධරයෙක්ම බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*(ඇ)* යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

*(ඈ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වසර 03 කට නොඅඩු කාලයක් බස්නාහිර පළාත තුළ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

*(ඉ)* තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම අතින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

*(ඊ)* බඳවා ගන්නා නිලධාරීන් ස්ථාන මාරුවලට යටත් විය යුතුය. බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

*(උ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. ඔවුන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

04. *සේවා කොන්දේසි.-*

4.1 මෙම තනතුරු ස්ථිර ය. අනුමත සේවා ව්‍යවස්ථාව/රජය විසින් පනවනු ලබන සේවා කොන්දේසිවලට යටත් වේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

5.1 තාක්ෂණ නිලධාරි (සත්ත්ව සංවර්ධන උපදේශක) III පන්තියේ තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් අය ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් පමණක් (සත්ත්ව සංවර්ධන උපදේශක) පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනේ. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අයදුම්පත් ලැබී ඇති විට පමණක් සුදුසුකම් ලත් අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. සමත් වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි.

5.2 *ලිඛිත විභාගය.-*

| *විෂයයන්* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |

06. *තාක්ෂණ සේවයේ (සත්ත්ව සංවර්ධන උපදේශක) III තනතුරට සහ (සත්ත්ව සංවර්ධන උපදේශක) පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණික සුදුසුකම්.-*

| *අංකය* | *තනතුර* | *අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්* | *තාක්ෂණික සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1 | (සත්ත්ව සංවර්ධන උපදේශක) III | සිංහල/දෙමළ/ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව සහ තවත් විෂයයකට සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය. | අ.පො.ස. (උ./පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව විෂය ධාරාව යටතේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂි විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් තුනකින් එකවර සමත් වීම හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ජෛව පද්ධති තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් දෙක සහිතව කෘෂි විද්‍යාව සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | 1. රජය විසින් අනුමත සත්ත්ව පාලන විද්‍යාලයකින් පිරිනමන ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමත කරන ලද සත්ත්ව පාලනය පිළිබඳ ජාතික ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම,<br>*හෝ*<br>2. කුණ්ඩසාලේ, අඟුණකොලපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, පාලමුනේ, ලබුදූව, වාරියපොල, වවුනියාව, අනුරාධපුරය, කරපිංච, නයිවල, පරන්තන් යන කෘෂිකර්ම විද්‍යාලයකින් සත්ත්ව පාලන විෂයය සහිතව කෘෂිකර්මය විෂයය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,<br>*හෝ*<br>3. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන සත්ත්ව පාලනය විෂයය සහිත ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව ලබා තිබීම (කෘෂිකර්මය පිළිබඳව),<br>*හෝ*<br>4. ඇක්වයිනාස් විශ්වවිද්‍යාල ආයතනය විසින් පිරිනමනු ලබන සත්ත්ව පාලන විෂයය සහිත කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,<br>*හෝ*<br>5. රජය විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන සත්ත්ව පාලන විෂයය සහිත දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,<br>*හෝ*<br>6. විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන සත්ත්ව පාලන විෂයය සහිත ඩිප්ලෝමාව (කෘෂිකර්මය පිළිබඳ) ලබා තිබීම,<br>*හෝ*<br>7. ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සමාන යැයි තාක්ෂණික සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්. |

| | | | | |
|---|---|---|---|---|
| 2 | (සත්ව සංවර්ධන උපදේශක) එක් වසරක පුහුණු කාලය | සිංහල/දෙමළ/ඉංග්‍රීසි, ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ. පො.ස. (සා. පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය. | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ජීව විද්‍යාව විෂය ධාරාව, යටතේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂි විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් තුනකින් එකවර සමත්වීම හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ජෛව පද්ධති තාක්ෂණවේදය තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් දෙක සහිතව කෘෂි විද්‍යාව සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | 1. කුණ්ඩසාලේ, අඟුණකොලපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, පාලමුනේ, ලබුදූව, වාරියපොල, වවුනියාව, අනුරාධපුරය, කරපිංච, නයිවල, පරන්තන් යන කෘෂිකර්ම විද්‍යාලයකින් සත්වපාලන විෂය සහිතව කෘෂිකර්මය විෂය පිළිබඳව එක් අවුරුදු පූර්ණකාලීන පුහුණු පාඨමාලාවක් සඳහා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම (කෘෂිකර්ම),<br>*හෝ*<br>2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක කෘෂිකර්ම විෂයය පිළිබඳව එක් අවුරුදු පූර්ණකාලීන පුහුණු පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතිකය ලබා තිබීම, හෝ<br>3. ඇක්වයිනාස් විශ්වවිද්‍යාල ආයතනය විසින් පිරිනමනු ලබන එක් අවුරුදු කෘෂිකර්ම පාඨමාලාව හදාරා සහතිකය ලබා තිබීම. |
| 3 | (සත්ව සංවර්ධන උපදේශක) පුහුණු කිරීමේ ශ්‍රේණිය දෙවසරක පුහුණු කාලය | සිංහල/දෙමළ/ඉංග්‍රීසි විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වී තිබිය යුතුය. | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ජීව විද්‍යාව විෂය ධාරාව යටතේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂි විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් තුනකින් එකවර සමත්වීම හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ජෛව පද්ධති තාක්ෂණවේදය තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් දෙක සහිතව කෘෂි විද්‍යාව සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | |

07. *තාක්ෂණ සේවයට අදාළ වැටුප් පරිමාණය.-*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MN 03-2016 අනුව තාක්ෂණ සේවයේ (සත්ව සංවර්ධන උපදේශක) III හිමි මාසික වැටුප් පරිමාණය රු. 31,040-445x10- 660 x11-730x10-750x10-රු. 57,550 වේ. නමුත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

*තාක්ෂණ සේවයේ (සත්ත්ව සංවර්ධන උපදේශක) පුහුණු කිරීමේ ශ්‍රේණියට හිමි මාසික වැටුප් පරිමාණය.-*

රා. ප. ච. 03/2016 හි උපලේඛන V හි තාක්ෂණ සේවය සඳහා අදාල මාසික දීමනාව හා ගැලපුම් දීමනාව හිමිවේ.

08. *තාක්ෂණ සේවයේ තනතුරු සඳහාවන තරග විභාගයේ විෂය නිර්දේශය.-*

(i) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි (ලකුණු 100)

මෙම ප්‍රශ්න පත්‍රය භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය සහ තර්කන ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ලබන කෙටි හා බහුවරණ ප්‍රශ්න පත්‍ර වේ.

(ii) විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය - සත්ත්ව පාලනය - කාලය පැය 02 යි. (ලකුණු 100)

ලිඛිත ප්‍රශ්න පත්‍රයකි.

01. ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා සත්ත්ව පාලන කටයුතු පිළිබඳ පවත්නා සම්පත්, විභවයන් වර්තමාන තත්වයන් හා ආර්ථිකයට ඇති දයකත්වය
02. ශ්‍රී ලංකාවේ සත්ත්ව නිෂ්පාදන රටා, නිෂ්පාදන ප්‍රමාණයන් හා අලෙවිකරණ ක්‍රම ශ්‍රී ලංකාවේ පවතින සත්ත්ව ගොවිපළ රටා, ඒවායේ පිහිටීම හා විසිරීම,
03. ගොවිපල සතුන් අභිජනනය සඳහා බහුලව යොදාගන්නා ක්‍රම
04. බෝවන සත්ත්ව රෝග මර්දන ක්‍රියා පිළිවෙත්, රෝගී සතුන්ගේ නියැදි රැස් කිරීම හා ප්‍රවාහනය
05. ඒකාබද්ධ ගොවිපල් ක්‍රම හා ප්‍රතිචක්‍රීයකරණ ක්‍රම
06. සත්ව පාලනය හා ආශ්‍රිත කර්මාන්ත කිරි සැකසීම, මස් සැකසීම, බිත්තර නිෂ්පාදන හා සත්ත්ව ආහාර නිෂ්පාදනය
07. සත්ව පාලනය හා ක්‍රියාවලියට අදාළ ආදායම් වියදම් ගණනය ක්‍රම, ගොවිපල් වාර්තාකරණය හා ගිණුම් විශ්ලේෂණය, සත්ව ගොවිපල, සැලසුම්කරණය,
08. විද්‍යාත්මක තොරතුරු ප්‍රචාරණ ක්‍රම භාවිතය හා ඒවායේ ඵලදයිතාවයන්.

09. *අයදුම් කිරීමේ ක්‍රමය.-*

9.1 සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු වේ. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 600 කි. මෙම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාර ගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

9.2 අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2018.12.23 දිනට හෝ ඊටපෙර ලැබෙන සේ ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බස්නාහිර පළාත), අංක 109, මහා වීදිය, බත්තරමුල්ල, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සත්ව සංවර්ධන උපදේශක තනතුරට බඳවා ගැනීමේ විභාගය 2018**" යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසියම් අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

9.3 අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 7.1 තෙක් පළමු පිටුවටද අංක 7.2 සිට ඉදිරියට අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.4 අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

9.5 නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

9.6 අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.psc.wp.gov.lk මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

9.7 අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවා ද, අනෙකුත් අයදුම්කරුවන් අත්සන රජයේ විද්‍යාලක විද්‍යාල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු දිවුරුම් කොමසාරිස්වරයකු නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු (රු. 498,960) වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු) බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

10. *විභාගයට ඇතුල්වීම.-*

10.1 නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේදී විභාග යට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10.2 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදු වනු ඇත.

10.3 අපේක්ෂකයාගේ අනන්‍යතාවය, තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයින් විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

11. *සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම.-*

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. *විභාග ක්‍රමය.-*

(i) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.
(ii) අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.

13. මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුලත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම, තැපෑල මගින් හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත.

14. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන/නොවන අදාළ කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

15. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

16. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව *(බ.ප.).*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීම - 2018*

විභාග අංකය : ..........

01. නිවේදනයේ අංක 1 අනුව ඉල්ලුම්කරන තනතුරු නාමය : ..........

02. භාෂා මාධ්‍යය :
(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

03. *(අ)* මුලකුරු සමග නම :..........

*(ආ)* සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :..........

..........

*(ඇ)* සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........

..........

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. (i) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..........

..........

(ii) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :..........

..........

(iii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න.)

කොළඹ : ☐ ගම්පහ : ☐ කළුතර : ☐

(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන.................................. දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය :

වර්ෂ :....................., මාස :....................., දින :......................

(v) දුරකථන අංකය :............................................................

05. (i) උපන් දිනය : වර්ෂය :....................., මාසය :....................., දිනය :......................

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2018.12.23 දිනට වයස :

වර්ෂ :....................., මාස :....................., දින :......................

06. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න) :

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

07. *අධ්‍යාපන සුදුසුකම්.-* (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 06 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාල සුදුසුකම් දැක්විය යුතු අතර සත්‍ය පිටපත් ඇමිණිය යුතුය.)

7.1 *නිවේදනය අනුව අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම් :*

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 5 | | |
| 2 | | | 6 | | |
| 3 | | | 7 | | |
| 4 | | | 8 | | |

7.2 *නිවේදනය අනුව අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම් :*

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 3 | | |
| 2 | | | 4 | | |

7.3 *තාක්ෂණික සුදුසුකම් :*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා වලංගු දිනය* |
|---|---|---|---|---|
| | | | | |

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :..........................................................................

ලදුපත් ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :......................................................

දිනය :..........................................

*ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න.*

09. ................................................................................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම්කර ඇති තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව දනිමි.

තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

..........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :...................................

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .....................................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ........................................................................ දින මා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

...................................,
අත්සන.

සහතික කරන අයගේ නම :.........................................................................
තනතුර හා නිලමුද්‍රාව :.........................................................................

මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු දිවුරුම් කොමසාරිස්වරයෙකු නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට් කළ* තනතුරක් දරන නිලධාරියෙකු, (රු. 498,960 වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු), බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.)

12-30/1

---

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර සේවා ගණයේ ජනපද නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විභාගය -2018

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඉහත තනතුරට අදාළව දැනට පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 1.1. *පොදු සුදුසුකම්.-*

- *(අ)* ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- *(ආ)* විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- *(ඇ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වසර 03 කට නොඅඩු කාලයක් බස්නාහිර පළාත තුළ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
- *(ඈ)* යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.
- *(ඉ)* සේවයට බඳවා ගැනීම සඳහාවන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.
- *(ඊ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතු ය.
- *(උ)* බඳවා ගන්නා නිලධාරීන් ස්ථාන මාරුවලට යටත් විය යුතුය. බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

*(ඓ)* බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

02. *සේවා කොන්දේසි.-*

2.1 මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

විවෘත ධාරාව යටතේ පමණි.

3.1 ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුස්සන් තෝරා ගනු ලැබේ.

3.2 *ලිඛිත විභාගය :*

| *විෂයන්* | *කාලය* | *මුළු ලකුණු ප්‍රමාණය* | *අවම සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

04. *තාක්ෂණ සේවයේ (ජනපද නිලධාරි) III තනතුරට බඳවා ගැනීමට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණික සුදුසුකම් :*

| *අංකය* | *තනතුර* | *අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්* | *තාක්ෂණික සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | (ගොවිපල යාන්ත්‍රික උපදේශක) III | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය. | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී විද්‍යා විෂය ධාරාව යටතේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනකින් එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | 1. කුණ්ඩසාලේ, අඟුණකොලපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොල, වවුනියාව, අනුරාධපුරය, කරපිංච පාලමුනේ, නයිවල, පරන්තන් යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,<br>*හෝ*<br>2. අම්පාර හාඩි කාර්මික ආයතනයෙන් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීම,<br>*හෝ*<br>3. ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,<br>*හෝ*<br>4. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක කෘෂිකර්ම විෂයය පිළිබඳව එක් අවුරුදු පූර්ණකාලීන පුහුණු පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතිකය ලබා තිබීම,<br>*හෝ* |

| අංකය | තනතුර | අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් | තාක්ෂණික සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | 5. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා NVQ 06 වන මට්ටමේ සුදුසුකම සම්පූර්ණ කර තිබීම,<br>6. ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම |

05. *තාක්ෂණ සේවයට අදාල වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 - MN 03 - 2016 අනුව තාක්ෂණ සේවයේ (ගොවිපළ යාන්ත්‍රික උපදේශක) III පන්තියට හිමි මාසික වැටුප් පරිමාණය - රු. 31,040-445 x 10-660 x 11-730 x 10-750 x 10-රු. 57,550 වේ. නමුත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

06. *තාක්ෂණ සේවයේ තනතුරු සඳහා වන තරග විභාගයේ විෂය නිර්දේශය :*

(i) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි (ලකුණු 100).

මෙම ප්‍රශ්න පත්‍රය භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය සහ තර්කන ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ලබන බහුවර්ණ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(ii) විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය - කාලය පැය 032යි (ලකුණු 100).

| | |
|---|---|
| 1. | **ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂි කර්මාන්තයේ දයකත්වය**<br>*(අ)* දළ ජාතික නිෂ්පාදනයට කෘෂි කර්මාන්තයේ දායකත්වය<br>*(ආ)* රැකියා නියුක්තිය<br>*(ඇ)* කෘෂි කර්මාන්තයේ අපනයන තත්වය |
| 2. | **ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම** |
| 3. | **පස සහ ශාඛ පෝෂණය**<br>*(අ)* පසේ ව්‍යුහය වයනය, භෞතික හා රසායනික ලවණතාවය භෝග වගාව කෙරෙහි එහි බලපෑම<br>*(ආ)* ශාඛ පෝෂණය පාංශු/ශාඛ පෝෂණය කළමනාකරණය<br>*(ඇ)* පැලෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු |
| 4. | **පාංශු රසායන පාංශු රක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම** |
| 5. | **වාරිමාර්ග ක්‍රම හා ජල කළමනාකරණය**<br>*(අ)* විවිධ බෝගවර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය<br>*(ආ)* ක්ෂුද්‍ර ජල කළමනාකරණ ක්‍රම<br>*(ඇ)* ජල වහනය හා එහි වැදගත්කම |
| 6. | **ගොවිපළ යාන්ත්‍රීකරණය**<br>*(අ)* ගොවිපල යාන්ත්‍රීකරණයේ වාසි අවාසි<br>*(ආ)* බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ<br>*(ඇ)* ජල සම්පාදන හා පැලෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ<br>*(ඈ)* ඉහත යන්ත්‍ර ක්‍රියා කරවීම හා නඩත්තුව |

| |
|---|
| 7. **කෘෂිකාර්මික ව්‍යාප්තිය**<br><br>*(අ)* කෘෂිකාර්මික ව්‍යාපෘති උපායමාර්ග හා ක්‍රමවේදය<br>*(ආ)* කෘෂිකාර්මික ව්‍යාපෘති සන්නිවේදන ක්‍රම |
| 8. **පටක රෝපණය**<br><br>*(අ)* පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම<br>*(ආ)* පටක රෝපණයේ භාවිතයන්/යෙදීම් උදාහරණ<br>*(ඇ)* පටක රෝපණයේ වාසි හා අවාසි |
| 9. **පැළෑටි නිරෝධායන පිළිබඳ දැනුම**<br><br>*(අ)* පැළෑටි නිරෝධායන රෙගුලාසි පිළිබඳ දැනුම<br>*(ඇ)* පැළෑටි නිරෝධායන ක්‍රම |
| 10. **ශාක සංරක්ෂණය**<br><br>*(අ)* ශාක සංරක්ෂණයේ වැදගත්කම (ශාක/ජාන ප්ලාස්ම) |
| 11. **ජාන තාක්ෂණය**<br><br>*(අ)* DNA වල වැදගත්කම<br>*(ආ)* ජානය යනු කවරෙක්ද එහි ක්‍රියාකාරීත්වය<br>*(ඇ)* DNA තාක්ෂණය යොදා ගැනීමේ අවස්ථා<br>*(ඈ)* ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මඟින් ශාක වැඩිදියුණු කිරීමට ඇති හැකියාව |
| 12. **ශ්‍රී ලංකාවේ ජනපද ව්‍යාපාරය හා මහවැලි ව්‍යාපාරය පිළිබඳ දැනුම**<br><br>*(අ)* ජනපද ව්‍යාපාරය පිහිටුවා ඇති ස්ථාන<br>*(ආ)* මහවැලි ව්‍යාපාරයට අයත් වන ප්‍රදේශ |
| 13. **ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම** |
| 14. **සිතියම් ආශ්‍රිත කරුණු පිළිබඳ දැනුම**<br><br>*(අ)* අනිලමානය, රොඩ් රේසරය, ඩම්පි ලෙවලය, තියෝඩර් ලයිටරය<br>*(ආ)* 1:50,000, 1:10,000 අඟලේ සිතියම හා අවසාන ගම් පිඹුර පිළිබඳ විස්තර |
| 15. **ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉඩම් පිළිබඳ හා ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු, ආයතන පිළිබඳ දැනුම ඉඩම් වර්ග**<br><br>රජයේ ඉඩම්, පුද්ගලික ඉඩම්, ප්‍රවේණි ඉඩම් |
| 16. **ඉඩම් සංවර්ධනය හා බෙදා දීම පිළිබඳ දැනුම**<br><br>වර්තමානයේ ඉඩම් සංවර්ධනය හා බෙදා දීම පිළිබඳ ක්‍රියාත්මක ජාතික වැඩ සටහන් පිළිබඳ අවබෝධය<br>ඉඩම් නොමැති පුද්ගලයින් හඳුනා ගැනීම<br>බිම් සවිය වැඩසටහන<br>ඉඩම් කැබලි ලක්ෂයේ වැඩ සටහන |
| 17. **රජ සමයේ සිට මේ දක්වා ඉඩම්වල අයිතිය බැහැර කිරීමට යොදාගත් ලේඛණ පිළිබඳ අවබෝධය**<br><br>*(අ)* සන්නස්, නින්දගම්<br>*(ආ)* බදුකර, ස්වර්ණභූමි, ජයභූමි, රත්නභූමි, රන්බිම |

*අයදුම් කිරීමේ ක්‍රමය.-*

7.1 සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු වේ. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 600කි. මෙම විභාග ගාස්තුව එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාර ගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

7.2 අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදි සම්පූර්ණ කොට 2018.12.23 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බස්නාහිර පළාත) අංක 109, මහා වීදිය, බත්තරමුල්ල, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **''බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර සේවා ගණයේ ජනපද නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විභාගය - 2018'' යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.** මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

7.3 අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 7.1 තෙක් පළමු පිටුවට ද, අංක 7.2 සිට ඉදිරියට අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.4 අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කල යුතු ය.

7.5 නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

7.6 අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් ප්‍රවේශපත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.psc.wp.gov.lk මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතු ය.

7.7 අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලයලත් අයෙකු විසින් අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවා ද, අනෙකුත් අයදුම්කරුවන් අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු (රු. 498,960) වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු) බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

08. *විභාගයට ඇතුල්වීම :*

8.1 නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේ දී ම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

8.2 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදු වනු ඇත.

8.3 අපේක්ෂකයාගේ අනන්‍යතාවය, තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයින් විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත ;
(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

09. *සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම :*

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාග යෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

10. *විභාග ක්‍රමය :*

(i) මෙම විභාගය සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.
(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.

11. මෙම විභාගයෙන් සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුලත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම, තැපැල මඟින් හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත.

12. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන /නොවන අදාළ කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

13. මෙම *ගැසට් නිවේදනය* සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

14. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ ද පළ කර ඇත.

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව *(බ. ප.),*

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විභාගය - 2018

විභාග අංකය : ☐

01. නිවේදනයේ අංක 1 අනුව ඉල්ලුම්කරන තනතුරු නාමය : ☐

02. භාෂා මාධ්‍යය :
(අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න)

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

03. *(අ)* මුලකුරු සමග නම :..........................................................................................

*(ආ)* සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :.........................................................................

..........................................................................................................................

*(ඇ)* සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.....................................................................

..........................................................................................................................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

04. (i) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................

..........................................................................................................................

(ii) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.......................................................................

..........................................................................................................................

(iii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න.)

කොළඹ : ☐ ගම්පහ : ☐ කළුතර : ☐

(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන.................................. දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය :

වර්ෂ :....................., මාස :....................., දින :......................

(v) දුරකථන අංකය :.............................................................

05. (i) උපන් දිනය : වර්ෂය :....................., මාසය :....................., දිනය :......................

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන ............................................. දිනට වයස :

වර්ෂ :....................., මාස :....................., දින :......................

06. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න) :

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

07. *අධ්‍යාපන සුදුසුකම්.-* (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 06 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාළ සුදුසුකම් දැක්විය යුතු අතර සත්‍ය පිටපත් ඇමිණිය යුතුය.)

7.1 *නිවේදනය අනුව අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම් :*

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 5 | | |
| 2 | | | 6 | | |
| 3 | | | 7 | | |
| 4 | | | 8 | | |

7.2 *නිවේදනය අනුව අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම් :*

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 3 | | |
| 2 | | | 4 | | |

7.3 *තාක්ෂණික සුදුසුකම් :*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා වලංගු දිනය* |
|---|---|---|---|---|
| | | | | |

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :.............................................................................

ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :.......................................................

දිනය :.....................................................................

*ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න.*

09. ............................................................................................................................ වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම්කර ඇති තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව දනිමි.

තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :....................................

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය .......................................................................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

....................................,
අත්සන.

සහතික කරන අයගේ නම :.........................................................................
තනතුර හා නිලමුද්‍රාව :.........................................................................

මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු දිවුරුම් කොමසාරිස්වරයෙකු නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට් කළ* තනතුරක් දරන නිලධාරියෙකු, (රු. 498,960 වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

12-30/2

---

**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපළ යාන්ත්‍රික උපදේශක තනතුරට බඳවා ගැනීමේ විභාගය - 2018

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඉහත තනතුරට අදාළව දැනට පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 1.1 *පොදු සුදුසුකම් :*

*(අ)* ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය
*(ආ)* විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
*(ඇ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වසර 03 කට නොඅඩු කාලයක් බස්නාහිර පළාත තුළ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
*(ඈ)* තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.
*(ඉ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතු ය.
*(ඊ)* බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

02. *සේවා කොන්දේසි :*

2.1 මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය, ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

විවෘත ධාරාව යටතේ පමණි.

3.1 ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුස්සන් තෝරාගනු ලැබේ.

3.2 *ලිඛිත විභාගය :*

| *විෂයයන්* | *කාලය* | *මුළු ලකුණු ප්‍රමාණය* | *අවම සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

04. *තාක්ෂණ සේවයේ (ගොවිපළ යාන්ත්‍රික) III තනතුරට බඳවා ගැනීමට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණික සුදුසුකම් :*

| *අංකය* | *තනතුර* | *අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්* | *තාක්ෂණික සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | (ගොවිපල යාන්ත්‍රික උපදේශක) III | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය. | සංයුක්ත ගණිතය රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, යාන්ත්‍රික තාක්ෂණවේදය, යන විෂයයන් දෙකක් (02) සහිතව විද්‍යා/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වී තිබිය යුතුය. | 1. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි කාර්මික ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ (යාන්ත්‍රික) ඩිප්ලෝමාව ලබා තිබීම,<br>*හෝ*<br>2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා (යාන්ත්‍රික) ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම,<br>*හෝ*<br>3. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික) ලබා තිබීම,<br>*හෝ*<br>4. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (යාන්ත්‍රික) ඩිප්ලෝමාව,<br>*හෝ*<br>5. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා NVQ 06 වන මට්ටමේ සුදුසුකම සම්පූර්ණ කර තිබීම,<br>*හෝ*<br>6. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතනවලින් විමසා, අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව/මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව, වෑල්ඩින් කිරීම, යාන්ත්‍රික වැඩපළ ශිල්ප ක්‍රම පිළිබඳ සුදුසුකම් ලබා තිබීම,<br>*හෝ* |

| අංකය | තනතුර | අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් | තාක්ෂණික සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | 7. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සම්පූර්ණ කර තිබීම. |

05. *තාක්ෂණ සේවයට අදාල වැටුප් පරිමාණය.-*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 - MN 03- 2016 අනුව තාක්ෂණ සේවයේ (ගොවිපළ යාන්ත්‍රික උපදේශක) III පන්තියට හිමි මාසික වැටුප් පරිමාණය - රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - 57,550 වේ. නමුත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන I හි සඳහන් පරිදි වේ.

06. *තාක්ෂණ සේවයේ තනතුරු සඳහා වන තරග විභාගයේ විෂය නිර්දේශය.-*

(i) බුද්ධි පරීක්ෂණය.- කාලය පැය 01 යි. (ලකුණු 100)

මෙම ප්‍රශ්න පත්‍රය තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන් තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ii) විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය - කාලය පැය 03 යි - (ලකුණු 100)

| |
|---|
| **පෑස්සුම්**<br><br>දැනට භාවිතයේ පවතින විවිධ ආකාරයේ පෑස්සුම් පිළිබඳ මූලධර්ම, පෑස්සුම් කිරීමේ දී භාවිත කරන ආම්පන්නවල සීරු මාරු කිරීම, පෑස්සුම් කටයුතු සඳහා ලෝහ ද්‍රව්‍ය සකස් කිරීම. |
| **කම්මල් වැඩ**<br><br>කම්මල් වැඩ සඳහා භාවිතා කරන, උපකරණ හා ආම්පන්න කම්මල්වැඩ සඳහා ලෝහ කොටස් පිළියෙල කිරීම, විවිධ ලෝහ වර්ග හඳුනාගැනීම, විවිධ හැඩයන් අනුව ලෝහ කොටස් තලා ගැනීමේ ක්‍රම. |
| **වඩු වැඩ**<br><br>වඩු වැඩ සඳහා භාවිතා කරන උපකරණ හා යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය සීරුමාරු කිරීම හා නඩත්තුව පිළිබඳ දැනුම, විවිධ දැව වර්ග හඳුනා ගැනීම, වඩු වැඩවලදී යොදාගන්නා පුට්ටු, දැව ආලේපන හා ඔප කිරීම පිළිබඳ දැනුම. |
| **වැඩපල යන්ත්‍ර**<br><br>ලියවන පට්ටල් වර්ග, ඒවායේ ක්‍රියාකාරීත්වය හා නඩත්තුව විවිධ කාර්යයන් සඳහා යොදා ගත යුතු යන්ත්‍ර තෝරා ගැනීම, විදුම් යන්ත්‍ර සහ සාමාන්‍ය වැඩපලක තිබිය යුතු යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය, සීරු මාරු කිරීම හා නඩත්තුව |
| **තහඩු වැඩ**<br><br>විවිධ හැඩයන් ලබා ගැනීම සඳහා තහඩු සලකුණු කිරීම, අවශ්‍ය හැඩයට නැමීම හා පෑස්සීම, තහඩු වැඩ සඳහා යොදා ගන්නා ආම්පන්න |
| **කැපුම්තල හා මිනුම් උපකරණ**<br><br>වැඩපලවල භාවිතා කරන යන්ත්‍ර සඳහා වන කැපුම්තල නිසි පරිදි මුවහත් කිරීම, කැපුම්තල වර්ග හඳුනා ගැනීම |

**ද්‍රව්‍යවල ගුණ හා සරල ගණනය කිරීම**

විවිධ ද්‍රව්‍යයන් හඳුනා ගැනීම, ද්‍රව්‍ය මත බල ක්‍රියා කිරීමේදී හැසිරීම්, පරිමාව, බලය, බල ඝූර්ණය, කාර්යය, කාර්යක්ෂමතාවය වැනි සරල ගණනය කිරීම්, ලෝහ මත තාපයේ ක්‍රියාව.

**මෝටර් යාන්ත්‍රික විද්‍යාව**

ස්නේහනයේ වැදගත්කම, ස්නේහන ක්‍රම හා ඒවායේ දෝෂ නිර්ණය කිරීම, ස්නේහන වර්ග හා ඒවා යෙදීම සඳහා භාවිතා කරන උපකරණ ටයර් හා ටියුබ් හඳුනා ගැනීම, ටයර් හා ටියුබ්වල සේවාවන් කිරීම මෝටර් වාහනවල එන්ජින් කොටස්, ක්ලච් පද්ධතිය, ගියර් පද්ධතිය බල සම්ප්‍රේෂණ පද්ධතිය හා චැසියේ විවිධ කොටස්වල ක්‍රියාකාරීත්වය දෝෂ නිර්ණය කිරීම හා අළුත්වැඩියාවන්, වාහන බොඩි කොටස්වල තහඩු වැඩ හා පින්තාරු කිරීම.

**විදුලි ඉංජිනේරු විද්‍යාව**

විදුලි මිනුම් හා උපකරණ
විදුලි මෝටර් හා විදුලි උත්පාදන යන්ත්‍ර
පරිපථ හඳුනා ගැනීම
වාහන හා කෘෂි යන්ත්‍රවල විදුලි පද්ධති

07. *අයදුම් කිරීමේ ක්‍රමය.-*

7.1 සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු වේ. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 600 කි. එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාර ගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

7.2 අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2018.12.23 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බස්නාහිර පළාත), අංක 109, මහා වීදිය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **''බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපළ යාන්ත්‍රික උපදේශක තනතුරට බඳවා ගැනීම - 2018'' යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.** මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

7.3 අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 7.1 තෙක් පළමු පිටුවටද, අංක 7.2 සිට ඉදිරියට අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.4 අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

7.5 නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරඟ විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට

පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

7.6 අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.psc.wp.gov.lk මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතු ය.

7.7 අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවාද, අනෙකුත් අයදුම්කරුවන් අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස් වරයෙකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, (රු. 4,98,960) වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු) බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

08. *විභාගයට ඇතුල්වීම :*

8.1 නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර. එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනි සිටීමට අවසර දෙනු නොලැබේ.

8.2 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදු වනු ඇත.

8.3 අපේක්ෂකයාගේ අනන්‍යතාවය, තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයින් විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

09. *සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම.-*

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන් ම යටපත් කර ඇතිනම්/ඔහු, ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

10. *විභාග ක්‍රමය :*

(i) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.
(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.

11. මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුලත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම, තැපැල මඟින් හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත.

12. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන/නොවන අදාළ කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

13. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

14. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp. gov.lk නිල වෙබ් අඩවියේ ද පළ කර ඇත.

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.).

2018 නොවැම්බර් මස 15 වැනි දින.

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ගොවිපළ යාන්ත්‍රික උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේ විභාගය - 2018**

විභාග අංකය : ☐

01. නිවේදනයේ අංක 1 අනුව ඉල්ලුම්කරන තනතුරු නාමය : ☐

02. භාෂා මාධ්‍යය :
(අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න)

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

03. *(අ)* මුලකුරු සමග නම :.......................................................................................................

*(ආ)* සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :............................................................................

.......................................................................................................

*(ඇ)* සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.......................................................................

.......................................................................................................

*(ඈ)* ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

04. (i) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :.......................................................................

.......................................................................................................

(ii) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :...................................................................

.......................................................................................................

(iii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න.)

කොළඹ : ☐ ගම්පහ : ☐ කළුතර : ☐

(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2018.12.23 දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය :

වර්ෂ :....................., මාස :....................., දින :.....................

(v) දුරකථන අංකය :............................................................

05. (i) උපන් දිනය : වර්ෂය :....................., මාසය :....................., දිනය :.....................

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2018.12.23 දිනට වයස :

වර්ෂ :....................., මාස :....................., දින :.....................

06. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න) :

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

07. *අධ්‍යාපන සුදුසුකම්.-* (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 06 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාළ සුදුසුකම් දැක්විය යුතු අතර සත්‍ය පිටපත් ඇමිණිය යුතුය.)

7.1 *නිවේදනය අනුව අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම් :*

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 5 | | |
| 2 | | | 6 | | |
| 3 | | | 7 | | |
| 4 | | | 8 | | |

7.2 *නිවේදනය අනුව අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම් :*

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 3 | | |
| 2 | | | 4 | | |

7.3 *තාක්ෂණික සුදුසුකම් :*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා වලංගු දිනය* |
|---|---|---|---|---|
| | | | | |

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :............................................................................

ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :......................................................

දිනය :.....................................................................

*ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න.*

09. ...................................................................................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම්කර ඇති තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව දනිමි.

තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :....................................

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ............................................................................ දින මා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

....................................,
අත්සන.

සහතික කරන අයගේ නම :..........................................................................
තනතුර හා නිලමුද්‍රාව :..........................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු දිවුරුම් කොමසාරිස්වරයෙකු නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට් කළ* තනතුරක් දරන නිලධාරියෙකු, (රු. 498,960/- ට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.)

12-30/3

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018 වර්ෂය** | | | |
| **දෙසැම්බර්** | 2018.12.07 | සිකුරාදා | 2018.11.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.14 | සිකුරාදා | 2018.11.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.21 | සිකුරාදා | 2018.12.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.28 | සිකුරාදා | 2018.12.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2019 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2019.01.04 | සිකුරාදා | 2018.12.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.01.11 | සිකුරාදා | 2018.12.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.01.18 | සිකුරාදා | 2019.01.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.01.25 | සිකුරාදා | 2019.01.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2019.02.01 | සිකුරාදා | 2019.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.08 | සිකුරාදා | 2019.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.15 | සිකුරාදා | 2019.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.22 | සිකුරාදා | 2019.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.